**ශීර්ෂය 250 - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 250 - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්

ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

---

ප්‍රධාන ලෙජර් ගිණුම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන ලෙජර් ගිණුම් යටතේ අත්තිකාරම් ගිණුම්, තැන්පත් ගිණුම්, රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර ඇපකාර සංගමයේ ගිණුම, ක්‍රවුන් ඒජන්තවරුන්ගේ ප්‍රේෂණ ගිණුම හා ක්‍රවුන් ඒජන්තවරුන්ගේ විනිමය අලාභ ගිණුම පවත්වා තිබුණි. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ගිණුම් හා තැන්පත් ගිණුම්වලට අදාළ ලැබීම් හා ගෙවීම් වෙන වෙනම පෙන්වා තිබුණි. අනෙක් ගිණුම් තුන පිළිබඳව විස්තර නොදක්වා ප්‍රධාන ලෙජර් ගිණුම ලැබීම් ලෙස රු.281,578 ක් ද, ගෙවීම් ලෙස රු.278,633,944 ක් දක්වා තිබුණි. එම ඒකාබද්ධ ලැබීම් හා ගෙවීම් පිළිබඳ හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මූල්‍ය කාර්යසාධන වාර්තාව පිළිබඳ ආකෘති පත්‍රය සකස්කර ඇත්තේ පොදුවේ සියලු වාර්තාකරණ ඒකකවලට අදාල වන පරිදිය. ඉදිරියේදී ආකෘති පත්‍රවල වෙනස්කම් සිදුකර ගැනීමට සටහන් කර ගතිමි. | එකම කරුණක් මත ඒකාබද්ධ කර තිබුණු ගිණුම් අතරින් දෙකක් පමණක් විස්තරාත්මකවද, අනෙක් ගිණුම් ඒකාබද්ධ කර පෙන්වන්නේ නම් එය මූල්‍ය ප්‍රකාශනවලින් පැහැදිලි කළ යුතු වීම. |

### 1.6.2 අක් මුදල් ගැලැපුම් ගිණුම

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.22,638,476 ක් වී තිබුණි. සංශෝධිත ACA – 7 ආකෘතියේ සඳහන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගැලපුම් ශේෂය රු.22,638,476 ක් වී තිබුණි. එම ශේෂය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අග්‍රිම ශේෂය සමඟ ගැලැපූ විට රු.45,276,952 ක් වේ. නමුත් අග්‍රිම ගැලපුම් ශේෂය සෘණ (-) | 2021 මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ 2021.11.26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි 7.5 ඡේදයට අනුව 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ශේෂය, අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය හා වසර අවසාන අග්‍රිම ශේෂයේ එකතුව සමාන විය යුතුය. | අංක SA/MAA/02/01/01 හා 2021 දෙසැම්බර් 30 දින නිකුත් කර තිබූ රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් ලබා දී තිබූ උපදෙස් තාර්කිකව ඉදිරිපත් කළ යුතු වීම. |

රු.22,638,476 ක් විය යුතුව තිබුණත් එය සංශෝධිත ACA 7 ආකෘතිය නිවැරදි ලෙස ඉදිරිපත් නොකර තිබීම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා ඇති සටහන් අනුව අග්‍රිම ගිණුමේ ශේෂය ශුන්‍ය අගයක් ලෙස තාර්කික ලෙස ඉදිරිපත් වී නොතිබුණි.

## 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්ගේ මුදල් වැය කිරීම් ලෙස භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් ලෙස රු.10,307,311 ක් දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා එම වටිනාකම රු.2,731,589 ක් වීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.7,575,722 කින් වැඩියෙන් දක්වා තිබුණි. | වඩාත් සුදුසු ආකාරයට මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් සකස් කිරීමට අවශ්‍ය උපදෙස් 2022 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමට අදාළ මාර්ගෝපදේශවල ඇතුළත් කිරීමට සටහන් කර ගෙන ඇත. | සුදුසු ආකෘති හා මාර්ගෝපදේශ මගින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම විධිමත් කළ යුතු වීම. |

## 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ භා.භා.ග.ප.66 ආකෘතිය සහ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන බඩු වට්ටෝරු පොත අතර වෙනස්කම් නිරීක්ෂණය වූ අතර ප්‍රධාන බඩු වට්ටෝරු පොත යාවත්කාලීන කිරීම හා පවත්වාගෙන යාම සතුටුදායක මට්ටමක නොතිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන බඩු වට්ටෝරු පොත නිවැරදිව තුලනය කර 2022.01.01 දිනට ශේෂ ඉදිරියට ගෙන යාවත්කාලීන කර පවත්වා ගෙන යාමට කටයුතු කරමින් පවතී. | යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මඟින් රජයේ සේවකයින් සඳහා දේපල ණය පොලී (1506) වැය විෂය සඳහා ලබාගෙන තිබුණු රු.75,000 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී උපයෝජනය නොකර සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි. | 2021 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් අපේක්ෂා කළ පරිදි දේපළ ණය ඉල්ලුම් නොකිරීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි විය. | අත්‍යාවශ්‍ය වියදම් සඳහා පමණක් පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මඟින් ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (2002) වැය විෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් රු.50,000 ක ප්‍රතිපාදනය සලසා තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | අරපිරිමැසුම්දායක ලෙස යන්ත්‍ර පරිහරණය හේතුවෙන් යන්ත්‍ර පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමේ අවශ්‍යතා වර්ෂය තුළ මතු නොවීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | මු.රෙ 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |
| (ඇ) | පුනරාවර්තන වැය විෂයයක් සහ මූලධන වැය විෂයයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 8,285,945 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එය එක් එක් වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 55 ක් හා සියයට 90 ක් වි තිබුණි. | රට තුළ විදේශ විනිමය හිඟකම හේතුවෙන් AGOA (Association of Government Accountants) හි වාර්ෂික දායක ගාස්තුව ගෙවීමට බැංකුව විසින් විදේශ විනිමය නිකුත් නොකිරීම, සැලසුම් කළ නේවාසික කාර්ය මණ්ඩල පුහුණුව අවලංගු කිරීම හා අන්තර් කාල සීමාව තුළ රාජ්‍ය ආයතන වලට ගැලපෙන පරිදි සකස් කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් (customized Accounting Standards) අනුමත නොකිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය. | මු.රෙ 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 දෙසැම්බර් 17 දින මියගිය නිලධාරියෙකුගෙන් හා 2013 දෙසැම්බර් 04 දින සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු එකතුව රු.297,799 ක ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | එක් නිලධාරිනියකගෙන් අයවීමට ඇති රු.164,953 ක ණය ශේෂය ජාතික රක්ෂණ භාර අරමුදලින් ලබා ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීති කටයුතු දෙපාර්තමේන්තුවෙන් විමසීම් කර ඇත.<br>තවත් නිලධාරියෙකුගේ හිඟහිට පවතින රු.164,953 ක ණය ශේෂය අය කර ගැනීමට නඩු පැවරීමෙන් පසු ඔහු විසින් ණය ශේෂය මුදලින් පියවීමට එකඟ බව ලිඛිතව දන්වා ඇත. එම ලිපිය ඉදිරි නීති කටයුතු සඳහා නීති කටයුතු දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. | හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා හෝ නිරවුල් කිරීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. |

### 2.2.2 විවිධ අත්තිකාරම් ගිණුම

2021 දෙසැම්බර් 31 දිනට විවිධ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 142,510,262 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට විවිධ අත්තිකාරම් ගිණුමේ වර්ෂ 05 කට වැඩි කාලයක් මුළුල්ලේ පැවැත එන රු.136,188,477 ක ශේෂයක් පැවැතුණි. එම ශේෂයෙන් සියයට 87 ක් හෙවත් රු.118,050,237 ක් පොළොන්නරුව, අනුරාධපුරය හා අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් අය විය යුතුව පැවතුණි. එම හිඟ හිටි අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට විවිධ අත්තිකාරම් ගිණුමේ හිඟ ශේෂය රු.142,510,261.69 කි. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මෙම හිඟ අත්තිකාරම් අයකර ගැනීම සඳහා අතරමැදියෙකු වශයෙන් පමණක් ක්‍රියා කරනු ලබන අතර අත්තිකාරම් අයකර ගැනීම සඳහා<br>ඍජුව මැදිහත් වීමට හැකියාවක් නොමැත. කෙසේ වෙතත් හිඟ ශේෂ අයකර ගැනීම සඳහා අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට හා ගොවිජන සේවා මධ්‍යස්ථානවලට උපදෙස් හා සහාය ලබාදෙමින් නිරන්තර පසු විපරම් කිරීම තුළින් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත. | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දින සිට පැවැත එන රු.1,652,917 ක හිඟහිටි අත්තිකාරම් ශේෂය, කොළඹ දන්තනායතනයේ 2002 ජනවාරි 22 දින සිදු වූ වැටුප් මංකොල්ලයට අදාළව නිකුත් කළ රු.2,408,460 ක අත්තිකාරම් වලින් නිරවුල් නොකළ රු.2,288,037 ක ශේෂය 2002 ජනවාරි 22 දින සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි අත්තිකාරම් ශේෂ 2022 මාර්තු 31 දින වන විටත් අයකර ගැනිමට හෝ කපාහැරිමට හෝ කටයුතු කර නොතිබුණි. | ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පියවිය යුතු රු.1,652,917 ක ණය ශේෂය සතොස වෙතින් අයවිය යුතුව තිබුණත්, එම ආයතනය විසින් විධිමත් ලේඛන නොමැති බව දන්වා ඇති හෙයින් තවමත් හිඟ හිටව පවතී. එය නිරවුල් කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් උපදෙස් අනුව කටයුතු කර ගතයුතු ඉදිරි පියවර පිළිබඳව තිරණය කිරීමට පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇත.<br><br>කොළඹ දන්තායතනයේ මුදල් මංකොල්ලයට අදාළව වූදිත නිලධාරියාගේ වැටුපෙන් සියයට 5 ක් වශයෙන් අයකර ගෙන තිබුණු රු.120,423 ක් රාජ්‍ය ආදායමට බැර කර තිබුණි. එම මුදල රාජ්‍ය ආදායමින් ආපසු ලබා ගෙන විවිධ අත්තිකාරම් ගිණුමට 2021 වර්ෂය තුළදී බැර කරන ලදී. ඉතිරි මුදල නිරවුල් කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග තිරණය කිරීම සඳහා ගොනු කර ඇති නඩුවේ වර්තමාන තත්ත්වය විමසා ඇත. | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. |
| (ඇ) | වර්ෂ 07 ක පමණ කාලයක් මුළුල්ලේ පැවැත එන කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් අයවිය යුතු රු.349,477 ක අත්තිකාරම් ශේෂය හා 2019 වර්ෂයේ සිට පැවැත එන ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු රු.12,552,764 ක අත්තිකාරම් ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනිමට අපොහොසත් වි තිබුණි. | කුරුණෑගල දිසිත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිරවුල් කළ යුතු රු.349,477 ක මුදල නිරවුල් කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග සඳහා විධිමත් පරීක්ෂණ මණ්ඩලයක් පත්කර නිර්දේශ ලබා ගැනීමට කටයුතු කිරීමට කුරුණෑගල දි.ලේ. කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරීවරයා එකඟ වී ඇත.<br><br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අනුරාධපුර ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය විසින් නිරවුල් කළයුතු මුදල සම්බන්ධයෙන් වාර්තා ලබාදෙන ලෙස දැනුම් දී ඇත. | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2019 මාර්තු 02 දින සිදුවී තිබුණු අනුරාධපුර ශික්ෂණ රෝහලේ මුදල් සොරකට අදාළව සෞඛ්‍යය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණු රු.6,321,785 ක අත්තිකාරම් 2022 මැයි 17 දින වන විටත් අයකර ගැනිමට අපොහොසත් වී තිබුණි. | සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් නිරවුල් කළ යුතු රු.6,321,785 ක් සම්බන්ධයෙන් අනුරාධපුර මූලස්ථාන පොලිසිය මඟින් පොලිස් පරීක්ෂණ සිදු කරනු ලබන බවත්, සොරකමට වගකිව යුතු පුද්ගලයින් මෙතෙක් හඳුනාගෙන නොමැති බවත් ඒ නිසා සෞඛ්‍ය අමාත්‍යාංශයේ විමර්ශන අංශය විසින් නැවත විමර්ශන කටයුතු ආරම්භ කර ඇති බවත් දන්වා ඇත. විමර්ශන කටයුතු අවසන් වූ පසු ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට නියමිතය. | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් සටහන - (iv), බැරකම් පිළිබඳ ප්‍රකාශය - (i) හි සඳහන් රු. 100,059 ක බැරකම් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් වල (එස්ජ් - 92) ඇතුළත් කර නොතිබුණි. | පුනරාවර්තන වියදම් සඳහා වූ වවුචර් පත් කිහිපයක් අතපසුවීමකින් 2022 වර්ෂයට අදාළ වියදම්හි ඇතුළත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සියළු බැදීම් හා බැරකම් හඳුනාගත හැකි වන පරිදි විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදිය යුතු වීම. |
| (ආ) | රාජ්‍ය ගිණුම් ක්‍රමය වැඩිදියුණු කළ මුදල් පදනමේ සිට උපචිත පදනමට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය සඳහා තාක්ෂණික උපදේශන ආයතනයක් සමඟ මාස 12 ක කාලසීමාවක් සඳහා 2019 ජූලි 15 දින දෙපාර්තමේන්තුව විසින් ගිවිසුමකට එළඹ තිබුණි. රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2022 ජනවාරි 12 දිනැති අංක SA/MAA/02/02/03/-vol(iii) දරන ලිපිය ප්‍රකාරව එම ආයතනය විසින් සපයන ලද කාර්යයන් (Deliverable) ගිවිසුම් ප්‍රකාරව ඉදිරිපත් කර තිබුණු අතර එම සේවාවන් වෙනුවෙන් තවදුරටත් ගෙවිය යුතු රු. 16,629,560 ක් 2021 දෙසැම්බර් 31 දිනට බැරකම් හා බැදීම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | තාක්ෂණික උපදේශක ආයතනය එකඟ වූ දිනට අදාළ කාර්යයන් (Deliverables) සඳහා කෙටුම්පත් වාර්තාවන් ඉදිරිපත් කර ඇත. කෙසේ වුවද ඒ සඳහා අදාළ ගෙවීම් සිදු කරනු ලබන්නේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට අවශ්‍ය පරිදි එම වාර්තාවන්හි සංශෝධන සිදු කර අවසාන වාර්තාවන් ඉදිරිපත් කිරීමෙන් අනතුරුවය. ගිණුම්කරණ රාමුව හා ප්‍රමිත සඳහා අනුමැතිය ලැබීම මත ඉදිරි කාර්යයන් රඳා පවතී. ඉහත තත්ත්වය මත තාක්ෂණික උපදේශන ආයතනයට ගෙවීමට ඇති මුදල බැරකම් හා බැදීම් ලෙස හඳුනා නොගන්නා ලදි. | මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සියළු බැදීම් හා බැරකම් හඳුනාගත හැකි වන පරිදි විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදිය යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

**(අ) රාජ්‍ය ගිණුම් ක්‍රමය වැඩිදියුණු කළ මුදල් පදනමේ සිට උපචිත පදනමට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය**

2018 අයවැය යෝජනා අංක 254 අනුව, ඉදිරි වර්ෂ 10 ඇතුළත මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම යටතේ පිළියෙල කිරීම සඳහා යෝජනා සම්මත වී තිබුණු අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම යටතේ පිළියෙල කිරීමේ ක්‍රියාවලිය සඳහා ඉදිරිපත් කළ මාර්ග සැලැස්මේ (Road Map) ඇතුළත් කාර්යයන්වලට අදාළව සිදු කරන ලද සංශෝධනයන් සඳහා 2022 මැයි 12 දින වන විටත් අනුමැතිය ලබාගෙන නොතිබුණි. | සංශෝධිත මාර්ග සැලැස්ම සඳහා මෙතෙක් අනුමැතිය ලබාගෙන නොමැති අතර නිශ්චිත ප්‍රතිපත්තිමය තීරණයකට එළඹීමෙන් අනතුරුව අදාළ පරිදි සංශෝධිත මාර්ග සැලැස්ම සඳහා අනුමැතිය ලබාගැනීමට නියමිතය. | අදාළ ප්‍රතිපත්තිමය තීරණවලට එළඹීම කඩිනමින් සිදු කර මාර්ග සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගත යුතු වීම. |
| (ii) | 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, අවශ්‍ය අයවැය ප්‍රතිපාදන සලසමින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උප ව්‍යාපෘතියක් ලෙස මෙම කාර්යය ක්‍රියාත්මක කිරීමේදී, “අන්තර්කාලය සඳහා ගිණුම්කරණ ක්‍රමවේදයක් හඳුන්වා දී පවත්වාගෙන යාම” ඇතුළත් කර තිබුණද, 2022 මැයි 19 දින වන විටත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLAPSAS) / ජාත්‍යන්තර රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත මත පදනම්ව සකස් කළ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත් ගිණුම්කරණ රාමුවේ කෙටුම්පත පමණක් පිළියෙල කර තිබුණි. | අන්තර්කාලය සඳහා කෙටුම්පත් කරන ලද ගිණුම්කරණ රාමුව හා ගිණුම්කරණ ප්‍රමිත 15ක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ ද, එහි සඳහන් කරුණු පිළිබඳ මෙතෙක් විගණකාධිපතිගේ නිර්දේශ ලැබී නොමැති බැවින් අදාළ ගිණුම්කරණ රාමුව හා ප්‍රමිත මේ වන විටත් කෙටුම්පත් මට්ටමේම පවතී. | පිළියෙල කර ඇති ගිණුම්කරණ ප්‍රමිති වලට ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ ප්‍රමිත නිකුත් කරනු ලබන ආයතනයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (iii) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) අංක 01 හි 28 වන ඡේදයෙහි විධිවිධාන පරිදි “මූල්‍ය ප්‍රකාශන අදාළ සෑම ප්‍රමිතියක්ම සියළු අවශ්‍යතා සමඟ අනුකූල වන්නේ නම් මිස මූල්‍ය | දැනට පවතින නීතිමය රාමුව තුළ අන්තර්කාලය සඳහා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත පූර්ණ වශයෙන් යොදා ගැනීමේ හැකියාවක් නොමැති බැවින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත මත පදනම්ව | පිළියෙල කර ඇති ගිණුම්කරණ ප්‍රමිති වලට ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ ප්‍රමිත නිකුත් කරනු ලබන ආයතනයේ අනුමැතිය ලබා ගැනීමට |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාශනවල ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූල වන්නේයැයි නොදැක්විය යුතුය.“ යනුවෙන් සඳහන් වී ඇති බැවින් දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLAPSAS) මුදල් පදනම මත අන්තර් කාලය සඳහා භාවිතා කිරිමට හා ඉන් බැහැරවීම සාධාරණීයකරණය කිරිමට ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කිරීමට හැකියාවක් නොමැති බව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2021 සැප්තැම්බර් 21 දිනැති ලිපියෙන් දන්වා තිබුණද, අන්තර් කාලය සඳහා සම්පූර්ණ ප්‍රමිතියම භාවිතා නොකර තෝරාගත් ගිණුම්කරණ මාර්ගෝපදේශ පමණක් භාවිතා කිරිමට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ කළමනාකරණය විසින් තීරණය කළ බව තාක්ෂණික උපදේශකයා විසින් පිළියෙල කර 2020 ජූලි 13 දින ඉදිරිපත් කරන ලද මාර්ග සැලැස්මෙහි (Deliverable 03) හි සඳහන් කර තිබුණි. | අන්තර්කාලය සඳහා ප්‍රායෝගිකව භාවිත කළ හැකි වෙනමම ගිණුම්කරණ ප්‍රමිත 15ක් කෙටුම්පත් කරන ලදී. | කටයුතු කළ යුතු වීම. |
| **(iv)** | ඉහත සඳහන් පරිදි අන්තර් කාලය සඳහා SLAPSAS භාවිතා කිරිමට හා ඉන් බැහැරවීම සාධාරණීයකරණය කිරිමට ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කිරීමට හැකියාවක් නොමැති බව සඳහන් කළද, අන්තර් කාලය සඳහා පිළියෙල කර කෙටුම්පත් ගිණුම්කරණ ප්‍රමිත එනම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලින්ද බැහැර වීම් ගණනාවක් පවතින බව නිරික්ෂණය විය. මේ අනුව SLAPSAS වලින් බැහැර වී අන්තර් කාලය සඳහා නව ගිණුම්කරණ ප්‍රමිත පිළියෙල කිරීම පදනම් විරහිත බව නිරික්ෂණය විය. | දැනට පවතින නීතිමය රාමුව තුළ අන්තර්කාලය සඳහා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත පූර්ණ වශයෙන් යොදා ගැනීමේ හැකියාවක් නොමැති බැවින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත මත පදනම්ව අන්තර්කාලය සඳහා ප්‍රායෝගිකව භාවිත කළ හැකි වෙනමම ගිණුම්කරණ ප්‍රමිත 15ක් කෙටුම්පත් කරන ලදී. | පිළියෙල කර ඇති ගිණුම්කරණ ප්‍රමිති වලට ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ ප්‍රමිත නිකුත් කරනු ලබන ආයතනයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(v)** | රාජ්‍ය ගිණුම් ක්‍රමය වැඩිදියුණු කළ මුදල් පදනමේ සිට උපචිත පදනමට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සහ Ernst and Young ආයතනය අතර වූ උපදේශන සේවා ගිවිසුමේ 2.3 ඡේදයේ සඳහන් විශේෂ කොන්දේසි (සංශෝධිත) අනුව, ගිවිසුම්ගත දින සිට මාස 12 කින් මෙම ගිවිසුම කල් ඉකුත් වුවද, ඒ සඳහා අදාළ සංශෝධන 2022 මැයි 12 දින විටත් සිදු කර නොතිබුණි. | පරිවර්තිත ක්‍රියාවලිය පිළිබඳ නිශ්චිත ප්‍රතිපත්තිමය තීරණයකට එළඹීමෙන් අනතුරුව උපදේශන සේවා ගිවිසුමට අවශ්‍ය සංශෝධන කිරීමට නියමිතය . | එළඹ තිබුණු ගිවිසුමේ සඳහන් කාල වකවානු වල අදාළ කාර්යන් ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. |

## (ආ) රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන පිළියෙල කිරීම

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජික රටක් ලෙස රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන අත්පොත - 2014 (GFSM -2014) අනුව මූල්‍ය දත්ත වර්ගීකරණය සහ මූල්‍ය සංඛ්‍යාන පිළියෙල කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සම්බන්ධීකරණ කමිටුව (CC) සඳහා වූ යොමු නියමයන් (TOR) පිළියෙල කිරීම කෙටුම්පත් අදියරේ පවතින අතර 2022 පෙබරවාරි මාසයේදී පවත්වන ලද තාක්ෂණික සහාය මෙහෙයුම (Technical Assistance Mission) මඟින්ද එම කටයුතු අවසන් කර ගිවිසුම් අත්සන් කරන ලෙස අවධාරණය කර තිබුණි. | යොමු නියමයන් (TOR) පිළිබඳව ඉදිරි සම්බන්ධීකරණ කමිටු (CC) රැස්වීමකදී සාකච්ඡා කර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ලබා දෙන මීලඟ තාක්ෂණික සහාය මෙහෙයුමේදී (Technical Assistance Mission) යොමු නියමයන් අවසන් කිරීමට බලාපොරොත්තු වේ. | තාක්ෂණික සහාය මෙහෙයුමේදී යොමු නියමයන් අවසන් කළ යුතු වීම. |
| (ii) | Budgetary Central Government (BCG) හි Extra Budgetary Units (EBU) සඳහා 2015-2018 මුදල් වර්ෂවලට අදාළ රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන එකතු කිරීම හා සම්පාදනය කිරීම 2021 අගෝස්තු මාසය වන විට අවසන් කිරීමට නියමිත වුවද, 2022 මැයි 31 දින වන විටත් එම කටයුතු සම්පූර්ණ කර නොතිබුණි. | Extra Budgetary Units සම්පාදනය කිරීමට ප්‍රථමයෙන් රජයට අයත් සියලුම ව්‍යාපාර ආයතන 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ඇගයීම හා වර්ගීකරණය සිදු කළ යුතුව තිබුණි. සමහර ආයතනවල මූල්‍ය ප්‍රකාශන සකස්කර නොතිබීම සහ එම ආයතනයන් මූල්‍ය ප්‍රකාශන නියමිත කාලය තුළ ලබා දීමට අපොහොසත් වීම හේතුවෙන් රජයට අයත් ව්‍යාපාර ආයතනවල මූල්‍ය ප්‍රකාශ රැස්කර ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද විය. | රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන එකතු කිරීම හා සම්පාදනය කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු වීම. |

<table>
<tr>
<td>(iii)</td>
<td>රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන අත්පොත - 2014 අනුව, මූල්‍ය කාර්යසාධනයට (financial operations) සහ මූල්‍ය තත්ත්වයට (financial position) අදාළ දත්ත විශ්ලේෂණය කිරීම අවශ්‍ය වුවද, Extra Budgetary Units හි විශ්ලේෂණාත්මක සමාලෝචනය (analytical review) සඳහා දෙපාර්තමේන්තුව විසින් ආදායම් ප්‍රකාශන දත්ත පමණක් යොදාගෙන තිබුණි.</td>
<td>රජයට අයත් ව්‍යාපාර ආයතන විශ්ලේෂණය සහ Extra Budgetary Units හි රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන සකස් කිරීම එකිනෙකට වෙනස් කාර්යයන් දෙකකි.<br>රජයට අයත් ව්‍යාපාර ආයතන විශ්ලේෂණය සඳහා මූල්‍ය කාර්ය සාධනයට අදාළ දත්ත පමණක් භාවිත කරනු ලැබේ. Extra Budgetary Units හි රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන සකස් කිරීමේදී මූල්‍ය කාර්යසාධනයට සහ මූල්‍ය තත්ත්වයට අදාල දත්ත යොදා ගැනේ.</td>
<td>රජයට අයත් ව්‍යාපාර ආයතන විශ්ලේෂණය හා රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන සකස් කිරීමේ කාර්යභාරය කඩිනමින් නිම කළ යුතු වීම.</td>
</tr>
<tr>
<td>(iv)</td>
<td>2019 වර්ෂයේදී තාක්ෂණික සහාය මෙහෙයුම (Technical Assistance Mission) විසින් ලබාදුන් සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මට අනුව partial (BCG) Central Government හි 2015 මූල්‍ය වර්ෂය සහ Budgetary Central Government හි 2015-2018 මූල්‍ය වර්ෂ සඳහා GFSM-2014 පදනම් කරගත් රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන පිළිවෙලින් 2020 සැප්තැම්බර් සහ 2021 ජුනි මාසවල ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත ඉදිරිපත් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් එය ඉටුකිරීමට අපොහොසත් වී තිබුණි.</td>
<td>රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා Partial Central Government හි රාජ්‍ය මූල්‍ය සංඛ්‍යානද 2015-2018 දක්වා Budgetary Central Government හි රාජ්‍ය මූල්‍ය සංඛ්‍යානද පිළියෙල කර ඇත. මෙම සකස් කළ සංඛ්‍යාන මුදල් අමාත්‍යාංශයේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධානීන්ගේ අනුමැතිය ගන්නා තෙක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත ඉදිරිපත් කළ නොහැක.</td>
<td>නියමිත කාලවකවානු තුළ විධිමත් අනුමැතින් ලද Partial Central Government හි රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන හා Budgetary Central Government හි රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන ද නියමිත කාලවකවානු තුළ අදාළ ආයතන වෙත ඉදිරිපත් කළ යුතු වීම.</td>
</tr>
<tr>
<td>(v)</td>
<td>2019 වර්ෂයේදී තාක්ෂණික සහාය මෙහෙයුම (Technical Assistance Mission) විසින් ලබාදුන් පහත නිර්දේශ 2022 මැයි 12 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.
<table>
<tr><th>නිර්දේශය</th><th>විස්තරය</th></tr>
<tr><td>3</td><td>බලධාරීන් විසින් මැත වර්ෂ හතර සඳහා පළාත් පාලනය පිළිබඳ මූලික ඇස්තමේන්තු සම්පාදනය කළ යුතුවීම.</td></tr>
<tr><td>6</td><td>රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ව්‍යවසායන් සඳහා කාර්තුමය වශයෙන් ආදායම්, වියදම් සහ</td></tr>
</table>
</td>
<td>2019 වර්ෂයේදී තාක්‍ෂණික සහාය මෙහෙයුම විසින් ලබා දුන් සමහර නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබීමට පහත හේතූන් බලපා ඇත.<br>• රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන සකස් කළ යුතු ආයතනික පරාසය (Coverage) පුළුල් කිරීම අනුක්‍රමයෙන් හා විශාල පරිශ්‍රමයකින් සිදු කළ යුතු වීම.<br>• කාර්තුමය වශයෙන් රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන සකස් කරන ලෙස නිර්දේශ ලබා දී තිබුණද රාජ්‍ය ව්‍යාපාර ආයතන කාර්තුමය වශයෙන් මූල්‍ය ප්‍රකාශන සකස් නොකිරීම හේතුවෙන් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගික නොවීම</td>
<td>තාක්ෂණික සහාය මෙහෙයුම විසින් ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු වීම.</td>
</tr>
</table>

| | | |
|---|---|---|
| 10 | ශේෂපත්‍රයට අදාළ දත්ත එකතු කිරීම සුරක්ෂිතව කිරීම.<br><br>සියළු වත්කම් සහ බැරකම් සඳහා වෙළඳපල හා නාමික තක්සේරුව සම්මත කර ගැනීම. | .<br>තාක්‍ෂණික සහාය මෙහෙයුම ලබා දුන් සමහර නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පෙර ප්‍රතිපත්තිමය තීරණ ගැනීම අත්‍යවශ්‍ය වීම. |

**(ඇ) පොදු තැන්පත් ගිණුම් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම**

2021 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුම්වල ශේෂය රු.බිලියන 82.32 ක් වූ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | පොදු තැන්පත් ගිණුම් ශුද්ධ ශේෂය රු.බිලියන 82.32 ක් වී තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ පැවති එකතුව රු.මිලියන 10.93 ක හර ශේෂ ගැලපීම මඟින් ශුද්ධ ශේෂය ගණනය කර තිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. මේ සම්බන්ධයෙන් කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංක 6003/0/0/01/00/00 දරන පොදු තැන්පත් ගිණුමේ පවතින රුපියල් මිලියන 10ක හර ශේෂය 2007 වර්ෂයේදී ගිණුම් ගත කරන ලද මාරු පත්‍රයේ වැරදි ගිණුම් සටහනක් හේතු කරගෙන උද්ගතවී ඇති අතර එම වරද ගිණුම් සාරාංශය මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට දැනුම් දී ඇත. | තැන්පත් ගිණුම් හර ශේෂයන් පැවතීම නිවැරදි ගිණුම්කරණය නොවන බැවින් එවැනි තත්ත්වයන් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |
| **(ii)** | 2015 ජූනි 24 දිනැති අංක 243/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, 6003 කාණ්ඩයේ තැන්පත් ගිණුම් ශුන්‍ය කිරීමට අපේක්ෂා කර තිබුණු අතර 2016 වර්ෂයේ සිට එම කටයුතු වාර්ෂික ඇස්තමේන්තුව හරහා සිදු කිරීමට උපදෙස් ලබා දී තිබුණි. එසේ වුවද, ගිණුම් අංක 6003/1 යටතේ වන තැන්පතු ගිණුමෙහි රු.මිලියන 10 ක් වූ ශේෂයක් නිරවුල් නොකර තවදුරටත් ඉදිරියට ගෙන යමින් පැවතුණි. එසේම මෙම ගිණුම් ශේෂය වර්ෂ ගණනාවක් මුළුල්ලේ පැවත එමින් තිබුණි. | | අදාල චක්‍රලේඛ විධිවිධාන ක්‍රියාත්මක කළ යුතු වීම. |
| **(iii)** | නියැදි පදනම මත තෝරාගත් ආයතන 20 ක පැවති තැන්පතු ගිණුම් 104 ක එකතුව රු.2,043,617,947 ක ශේෂ වර්ෂ 02 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. | දීර්ඝකාලීන වශයෙන් පැවත එන තැන්පත් ගිණුම් සම්බන්ධව ආයතන 187ක් විසින් ඉදිරිපත් කර ඇති පොදු තැන්පත් ශේෂ සැසඳුම් ප්‍රකාශ සහ කාල විශ්ලේෂණ වාර්තා අනුව, මු.රෙ.570 යටතේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කරන ලෙස නිරන්තරයෙන් අදාළ ආයතන වෙත ලිඛිතව දන්වා ඇත | කල් ඉකුත් වූ තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**(ඇ) රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය ඇපකාර සංගමයේ ක්‍රියාකාරීත්වය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1947 සැප්තැම්බර් 24 දින ප්‍රසිද්ධ කරනු ලැබූ අංක 9773 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් පිහිටුවා ඇති රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය ඇපකාර සංගමය මුදල් රෙගුලාසි 880 සිට 893 දක්වා රෙගුලාසිවලින් පෙන්වා දී ඇති අවශ්‍යතාවය පරිදි පවත්වාගෙන යන අතර 2022 මැයි 12 දින වන විට සාමාජිකයන් 4,870 ක් වෙනුවෙන් ඇප සුරුකුම්පත් නිකුත් කර තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය ඇපකාර සංගම් ගිණුමේ ශේෂය රු. 370,023 ක් විය. එමෙන්ම, එක් එක් නිලධාරීන් විසින් තැබිය යුතු ඇප වටිනාකම් 2022 මැයි 12 දින වන විටත් සංශෝධනය කර නොතිබුණි. | රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය ඇපකාර සංගමය ඇප තැබිය යුතු රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් පිහිටුවා ඇති එක් ආයතනයක් පමණක් වන අතර සාමාජිකයින් සඳහා තැබිය යුතු ඇප වටිනාකම තීරණය කිරීමට නෛතික බලයක් සංගමයට නොමැත. | ඇප තැබිය යුතු එක් ආයතනයක් වන රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය ඇපකාර සංගමය විසින් යාවත්කාලීන විය යුතු අවස්ථා අදාළ බලධාරීන්ට දැනුම් දිය යුතු වීම. |

## 3.2 වත්කම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට රු.40,122,186 ක මූල්‍ය නොවන වත්කම් ශේෂයෙහි ඇතුළත් සමාලෝචිත වර්ෂයේ මිලදී ගන්නා ලද වෙනත් යන්ත්‍ර හා උපකරණවල (2.2 – Other Machinary and Equipment) වටිනාකම රු. 2,731,589 ක් විය. ඒසීඒ - 6 ආකෘතිය ප්‍රකාරව, එම වටිනාකම කාර්යාල උපකරණ, පරිගණක උපකරණ හා ගෘහභාණ්ඩ මිලදී ගැනීම්වලින් සමන්විත වන අතර එම එක් එක් කාණ්ඩයට අයත් මිලදී ගැනීම්වල වටිනාකම තහවුරු කරගැනීමට ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | එක් එක් කාණ්ඩයට අයත් මිලදී ගැනීම්වල වටිනාකම 2021 වර්ෂයේ මූලධන වවුචර් පරීක්ෂා කිරීමෙන් තහවුරු කර ගත හැකි වේ. | එක් එක් කාණ්ඩයට අයත් මිලදී ගැනීම්වල වටිනාකම් තහවුරු කර ගත හැකි පරිදි ලිපිලේඛන පවත්වා ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 වන ඡේදය ප්‍රකාරව වාහනයක අභ්‍යන්තර අළුත්වැඩියාවකදී ඉදිරිපත් කර ඇති මිල ගණන්වල සාධාරණත්වය සම්බන්ධයෙන් රජයේ සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ වාර්තාවක් ලබාගත යුතු වුවද, එසේ වාර්තාවක් ලබා නොගෙන මුදල් අමාත්‍යාංශයේ ප්‍රවාහන නිලධාරීගේ නිර්දේශ සහිතව අළුත්වැඩියාවන් සිදු කර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. | මුදල් අමාත්‍යාංශයේ සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයකු නොමැති නිසා මුදල් අමාත්‍යාංශයේ ප්‍රවාහන නිලධාරියාගේ නිර්දේශය මත වාහන අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදී. 2022.04.01 දින සිට ජනාධිපති ලේකම් කාර්යාලයේ යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ හෝ කාර්මික මණ්ඩලයේ යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ නිර්දේශය මත සියලු අළුත්වැඩියා කිරිම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව සුදුසුකම්ලත් නිලධාරියෙකුගෙන් අදාළ වාර්තා ලබාගත යුතු වීම. |

## 3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 11 දින නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගිණුම්) තනතුර සඳහා අනුයුක්ත කරන ලද නිලධාරියා 2022 අප්‍රේල් 27 දින වන විටත් මුදල් රෙගුලාසි 881 ප්‍රකාරව ඇප තැබීමට කටයුතු කර නොතිබුණි. | නියෝජ්‍ය අධ්‍යක්ෂකගේ (මුදල්) ඉල්ලුම් පත්‍රය අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

------------------------------------

## 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය

-------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පැවති පුරප්පාඩු 50 තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 11 ක් පැවතුණි. | පසුගිය වර්ෂයේ දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාවට අතිරේකව ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු තුනක් (03) අනුමත කර ඇති අතර, දෙපාර්තමේන්තුවේ ITMIS අංශය සඳහා ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු අටක් (08) අනුමත කර ඇත.<br><br>නව තනතුරු සඳහා නිලධාරින්ගේ පත් කිරිම් සිදු කර දෙන ලෙස මුදල් අමාත්‍යාංශ ලේකම් මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇත. | පුරප්පාඩු පිරවීමට හෝ කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට හෝ කටයුතු කළ යුතු වීම. |